නිපුණතාව - පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණ කරණයේ යෙදෙයි.

නිපුණතා මට්ටම - රෙදිපිළි සඳහා ව්‍යාප්ත සැරසිලි නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම් - කාන්තා පිරිමි භාවිතයට සුදුසු රෙදිපිළි සඳහා ව්‍යාප්ත මෝස්තර නිර්මාණය කරයි.

පැවරුම - කාන්තා පිරිමි ඇඳුම් සඳහා සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් පහත පියවර අනුව නිර්මාණය කරන්න

පියවර 1 - ඔබ නිවසේ ඇති විවිධ හැඩතල යොද මින් අලංකාර කර ඇති ඇඳුම් රෙදි කිහිපයක් තෝරාගෙන ඒවා හොඳින් අධ්‍යයනය කරන්න.

පියවර 2 - ව්‍යාප්ත මෝස්තර යනු ''ආරම්භයක්, අවසානයක්, රටාවක් නැති, මැද කොටසක් නිශ්චිතව හඳුනාගත නොහැකි සමස්ත කාලය පුරා අඛණ්ඩව අලංකාරව විහිදී ගිය මෝස්තරයකි'' මේ අනුව ඔබ සතුව ඇති රෙදි පිළිවෙලින් රෙදි පිළි වලින් ව්‍යාප්ත මෝස්තර යෙදූ රෙදිපිළි තෝරා හොඳින් අධ්‍යයනය කරන්න.

පියවර 3 - එම රෙදි පිලිවෙල යොදාගෙන ඇති විවිධ මල් කොළ ජ්‍යාමිතික හැඩතල කාටූන් රූප හා විවිධ සරල රූපා ආදිය නිරීක්ෂණය කොට එවැනි සරල රූපයක් නිර්මාණය කර ව්‍යාප්ත මෝස්තරයක සුදුසු මෝස්තර ඒකකයක් නිර්මාණය කරන්න (කවකටුව,මිනුම් උපකරණ ආදිය යොදා ගන්න).

පියවර 4 - ඔබ නිර්මාණය කරගත් මෝස්තර ඒකකය ට්‍රෙෂු කඩදාසි (සව්කොල) ආධාරයෙන් ඔබගේ අඳින කඩදාසිය මත තලය සමබර වන ලෙස ආරම්භයක්, මැදක්, අවසානයක්, නිශ්චිත රටාවක් නොපෙනෙන පරිදි සමස්ත අඳින්න කඩදාසිය පුරා යොදාගන්න.

පියවර 5 - ඔබ නිර්මාණය කරගත් ව්‍යාප්ත මෝස්තර අධ්‍යයනයට යොදාගත් රෙදි පිළි වල වර්ණ යොදා ඇති ආකාරයට ඔබගේ රෙදිපිළි මෝස්තර කාන්තා පිරිමි ළමා වැඩිහිටි ආදියට ගැලපෙන පරිදි වර්ණ තෝරා ගනිමින් වර්ණ කරන්න.

(වර්ණ කිරීම් ශිල්පක්‍රම ඔබගේ වර්ණ මාධ්‍යයට අනුව youtube වැනි අන්තර්ජාල සෙවුම් මගින් අධ්‍යයනය කරන්න )

ඉහත පියවර වලට අනුකූලව ''ළමා ඇඳ ඇඳ ඇතිරිල්ලක්'' සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.